## ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

## පුරප්පාඩු දැන්වීමයි

### පොම්ප ක්‍රියාකාරු (ජාතික නිවාඩු නිකේතනය - පාසිකුඩා, පුරප්පාඩු 02)

### තනතුරට අදාල කාර්යයන්

- අධීක්ෂණ නිළධාරීගේ සෘජු අධීක්ෂණය යටතේ ජලය ගබඩාකිරීම සහ බෙදා හැරීම
- අපවිත්‍ර ජලය රැස් කිරීම සහ එය මුදා හැරීම
- භාවිතාකරන උපාංග සහ උපකරණ යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියාකිරීම සහ නඩත්තුව
- නල සවිකිරීම, වෙල්ඩින් කිරීම, අවහිරතා ඉවත්කිරීම, ඉලෙක්ට්‍රොනික පාලන ක්‍රම අලුත්වැඩියාකිරීම වැනි විදුලි කාර්මික කටයුතු සිදුකිරීම
- අඛණ්ඩ සේවාවක් ලබාදීම සදහා සහයෝගය ලබාදීම
- අංශභාර ප්‍රධානී හා/ හෝ ආයතන ප්‍රධානී විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරීන් ඉටුකිරීම.

### සුදුසුකම්

### බාහිර අයදුම්කරුවන්

*තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවය (NVQ) දෙවැනි (2) මට්ටමට නොඅඩු මට්ටමක මෝටර් කාර්මික/ ජල කාර්මික සම්බන්ධ තනතුරට අදාළ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.*

### අභ්‍යන්තර අයදුම්කරුවන්

*අදාළ ක්ෂේත්‍රයෙහි වසර පහක (5) ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින්/ වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්යභාරයට අනුකුලවන වෘත්තීය පරීක්ෂණයක (Trade Test) තහවුරු කෙරෙන ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවෙනි (2) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබාතිබීම.*

*හෝ*

*තනතුරෙහි කාර්ය භාරයට අදාලව තෘත්තීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිලිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවෙනි (2) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.*

### වයස

*අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.*

**වැටුප් පරිමාණය**

PL 2 රු. 25,750/- 10 x රු.270/- 10 x රු.300/- 10 x රු.330/- 12 x රු.350/- රු.38,950/-

**මූලික වැටුප් තලය**

රු. 25.750/- + ජීවන වියදම් දීමනාව + විශේෂ දීමනාව

ප්‍රතිලාභ

- සේවකයා සහ පවුල ආවරණය වන ආකර්ශනීය වෛද්‍ය රක්ෂණ ක්‍රමයක්
- ණය පහසුකම්
- වෘත්තීය දියුණුව සඳහා පුහුණු අවස්ථා
- ප්‍රවාහන දීමනාව

උනන්දුවක් දක්වන සුදුසුකම් සපුරන අපේක්ෂකයින් අපගේ වෙබ් අඩවියෙන් https://www.sltda.gov.lk/en/careers අයදුම්පත්‍රය බාගත කළ හැකිය.

ඔබ රැකියාවට සුදුසු යැයි ඔබ සිතන්නේ නම් ඥාති නොවන දෙදෙනකුගේ නම් ඇතුළත් ඔබේ ජීව දත්ත (CV), අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්වල සහතික පත්වල පිටපත්, සේවා පළපුරුද්ද ඇතුළත් සේවා සහතිකවල පිටපත් සමග සම්පූර්ණ කරන ලද ඔබේ අයදුම් පත්‍රය ලියාපදිංචි තැපැල හරහා සභාපති, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, 80, ගාලු පාර, කොළඹ 03 යන ලිපිනයට 13.12.2024 දින හෝ ඊට පෙර එවන්න.

ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ ඔබ අයදුම් කරන තනතුර සඳහන් කරන්න.

රජයේ දෙපාර්තමේන්තු/රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අපේක්ෂකයින් තම අයදුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් හරහා ඉදිරිපත් කළ යුතුය.

**සභාපති**
**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය**
**80, ගාලු පාර**
**කොළඹ 03**